

# පුංචි මගේ කතන්දර

නෙතුම්සා මිනදි හේරත්


හා අම්මාගේ නුවණ
MAHA CARTOON
නෙතුම්සා මිනදි හේරත්

# පිදුම

ආදරණීය
ගයනි ගුරුතුමියට
සෙනෙහසින් පුදමි.

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි .

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර
විදුහල්පතිනිය
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර
2023.11.01

එක දවසක් හා අම්මයි හා පුතයි කැළයක ජීවත් වුණා.






ඒ කැලයේ නපුරු සිංහයෙක් ජීවත් වුනා.



ඒ සිංහයා දඩයමක් හොයා ගෙන යද්දී හා අම්මයි හා පුතයි හම්බ වුණා. සිංහයා ටිකෙන් ටික ලංවුණා. හා අම්මා බේරෙන්න විදිහක් කල්පනා කළා.

හා අම්මා කිවුවා. " අනේ සිංහයෝ අපි දෙන්නම චුටීනේ. ඉතින් අපි දෙන්නා කෑවත් ඔයාගේ බඩ පිරෙන්නේ නෑනේ. මම දන්නවා හොඳ දඩයමක් තියෙන තැනක්, එන්න මම තැන පෙන්නන්නම්." කියලා හා අම්මා විලක් ගාවට සිංහයාව එක්කරගෙන ගියා.



සිංහයාගේ හෙවණැල්ල විලේ පෙනේන කොට සිංහයා එකපාරටම විලට පැන්නා. සිංහයා මඩේ එරුණා. හා අම්මායි හා පුතයි සතුටින් ජීවත් වුණා.



# පුංචි කොටි පැංචා





එක දවසක් කොටි අම්මයි කොටි පුතයි කැලයක ජීවත් වුණා. එක දවසක් කොටි අම්මා කෑම හොයන්න ගියා. ඊට පස්සේ දඟකාර කොටි පැංචා ගහක් උඩට නැගලා.

Adobe Stock | #164156715



කොටි අම්මා එද්දි දඟකාර කොටි පැංචාට බිමට බැහැගන්න බැරිවුණා. “ඔතනින් පනින්න පුතේ වැටුනොත් මම අල්ලන්නම්.”



කොටි අම්මා කිවුවට පස්සේ

කොටි පැංචා පැන්නා.

කොටි අම්මා කිවුවා "

පුතේ ඒවාගේ දැඟ වැඩ කරන්න එපා.

මගේ හොඳ පුතා."


හොඳ තාරාවා

එක දවසක් විලක හංසයෙක් ජීවත් වුණා. එක දවසක් හංසයා විලේ පීන පීන ඉද්දි හංසයාගේ කකුල ගහක වැදිලා තුවාල වුණා.






දුක දරා ගන්න බැරිවෙලා හංසයා අඬ අඬ ඉද්දි තාරාවෙක් ආවා."ඇයි හංසයෝ ඔයා අඬ අඬ ඉන්නේ."
" අනේ යළුවේ, මගේ කකුල තුවාල වුණානේ" හංසයා කිවුවා.

“හරි මම තුවාලෙට බෙහෙත් දාන්නම්. එන්න මාත් එක්ක.” තරාවයි හංසයයි බෙහෙත් කොළ තියෙන තැනකට ගියා. තාරාවා හංසයාගේ කකුලට බෙහෙත් දැම්මා. හංසයා තාරාවට ස්තුති කළා.



"යාළු ඔයා මගේ කකුලට බෙහෙත් දැම්මේ නැත්තම් මගේ කකුළ පැසවලා මම මැරිලා යයි. ඔයා හොඳ තාරාවෙක්, ඉන් පසු දෙදෙනාම සතුටින් ජීවත් වුණා.



# බලු පැංචා



එකමත් එක කාලේක පුංචි ගමක බලු පවුලක් ජීවත් වුණා. බලු අම්මයි බලු තාත්තයි දවසක් කෑම හොයන්න ගියා. බලු පුතා තනියෙම ගෙදර හිටියේ, බලු පුතා තනියම සෙල්ලම්කර කර ඉන්නකොට එයාට ශබ්දයක් ඇහුණා.



බලු පුතා දැක්කා හාවෙක් උගුලකට අහුවෙලා ඉන්නවා. යාළුවේ ඔයාට පුළුවන්ද මාව බේරගන්න හාවා ඇහැව්වා. ඊට පස්සේ බලු පුතා කටෙන් හාවාගේ කකුල අහුවෙලා තිබුන උගුල ලිහුවා. ඊට පස්සේ දෙදෙනාම එතිනින් දුවලා ගියා.



මේ ගැන අම්මටයි, තාත්තාටයි බලු පුතා කිව්වා. ඔයා කරේ හොඳ වැඩක් ඒ උනාට එකෙන් ඔයාටත් කරදරයක් වෙන්න පුළුවන් ඒක නිසා ආයෙත් ඔය වගේ වැඩ කරන්න එපා, බලු අම්මා අවවාද කළා. ඊට පස්සේ බලු අම්මායි, බලු තාත්තයි, බලු පුතයි සතුටින් ජීවත් වුණා.



# පසුවදන



නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම  ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින්  රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම  වැනි බහුවිධ පරමාර්ථ ඇතිව  2014 වසරේ දී මා විසින්  අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන  ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචානා කරන්නට විය ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්මින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට  මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි  ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි  පතමු . .

**මෙයට**
**සෙනෙවිරත්න මහලේකම්**
**පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක**
**2023.11.01**